සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

| 33 | S | I |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

## Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ............................ ගිණුම්කරණය I කාලය පැය දෙකයි

**උපදෙස්**

- ♦ අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ♦ අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- ♦ සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමි වේ.
- ♦ විභාග අංකය ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

| ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

01. ආයතනයක ගිණුම් තැබීමේ ප්‍රධාන අරමුණ වන්නේ,
1. ලාභය හෝ අලාභය ගණනය කිරීම.
2. ආදායම් වියදම් ගිණුම්ගත කිරීම.
3. ගනුදෙනු පොත්වල වාර්තා කිරීම.
4. ඇල්මක් දක්වන පාර්ශවයන්ට තිරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම.
5. නීතිමය අවශ්‍යතාවය ඉටුකිරීම. (.......)

02. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව ගිණුම්කරණ තොරතුරුවල දැකිය හැකි මූලික ගුණාත්මක ගතිලක්ෂණ පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,
1. අදාළ බව සහ රහස්‍ය බව
2. අදාල බව සහ සන්සන්දනය කළහැකි බව.
3. සත්‍යාපනය කළහැකි බව සහ යාවත්කාලීන බව
4. අවබෝධ කරගත හැකි බව සහ අදාළ බව
5. විශ්වසනීය නියෝජනය සහ අදාළ බව (.......)

03. ව්‍යාපාරයක් සෑම ගිණුම් වර්ෂයක් අවසානයේදී ම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අදාළ වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,
1. කාලච්ඡේද සංකල්පය
2. ගැලපුම් සංකල්පය
3. උපලබ්ධි සංකල්පය
4. ව්‍යාපාර ඒකක සංකල්පය
5. ආරක්ෂණ සංකල්පය (.......)

04. රු. 200,000 පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 240,000 ට ණයට විකුණු අතර ණයගැතියා විසින් රු. 60,000 ක් වූ තොග ආපසු එවා ඇත. මෙම ගනුදෙනුවල ශුද්ධ බලපෑම නිවැරදිව දැක්වෙන ගිණුම්කරණ සමීකරණය වන්නේ,

| | වත්කම් | = | වගකීම් | + | හිමිකම් |
|---|---|---|---|---|---|
| 1. | + 30,000 | = | - | | +30,000 |
| 2. | + 40,000 | = | | | +40,000 |
| 3. | + 30,000 | = | + 60,000 | | - 30,000 |
| 4. | +50,000 | = | + 20,000 | | - 30,000 |
| 5. | +180,000 | = | + 150,000 | | +30,000 |

(.......)

05. ගනුදෙනුව, මූලාශ්‍ර ලේඛනය හා ඊට අදාල උපයෝගී පොත නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

| | | | | |
|---|---|---|---|---|
| 1. බොල්ණය කපා හැරීම | - | විකුණුම් ඉන්වොයිසිය | - | විකුණුම් ජ'නලය |
| 2. ලී බඩු ණයට ගැනුම් | - | ගැනුම් ඉන්වොයිසිය | - | ගැනුම් ජ'නලය |
| 3. අඩමාණ ණය වෙන්කිරීම | - | ජ'නල් වවුචරය | - | පොදු ජ'නලය |
| 4. ණයහිමියන්ට ගෙවීම් | - | ලදුපත | - | මුදල් ලැබීම් ජ'නලය |
| 5. සුළු මුදල් අග්‍රිමය ගෙවීම | - | සුළු මුදල් වවුචරය | - | සුළු මුදල් පොත |

(.......)

06. මුදල් ගිණුමේ ශේෂයට වඩා බැංකු ප්‍රකාශනයේ ශේෂය වැඩිවීමට බලපාන හේතු පමණක් ඇතුලත් කාණ්ඩය වන්නේ,

1. තැන්පත් කළ උපලබ්ධි නොවූ චෙක්පත් හා ඍජු ප්‍රේෂණ
2. ස්ථාවර නියෝග සහ නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්
3. ස්ථාවර නියෝග සහ බැංකු ගාස්තු
4. ඍජු ප්‍රේෂණ සහ නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්
5. ඍජු ප්‍රේෂණ සහ ස්ථාවර නියෝග (.......)

07. රු. 690,000 (:15% VAT සහිත) මිලට ණයට විකුණු භාණ්ඩ වලින් රු. 57,500 ක් ආපසු එවා ඇත. ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත යුතු ශුද්ධ විකුණුම් වටිනාකම සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගත යුතු VAT බදු වගකීම වන්නේ,

| | ශුද්ධ විකුණුම් වටිනාකම (රු.) | VAT බදු වගකීම (රු.) |
|---|---|---|
| 1. | 550,000 | 82,500 |
| 2. | 600,000 | 82,500 |
| 3. | 600,000 | 90,000 |
| 4. | 690,000 | 82,500 |
| 5. | 690,000 | 90,000 |

(.......)

- **පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 08 සහ 09 සඳහා පිළිතුරු සපයන්න.**
  **ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසුව පහත ගිණුම්කරණ වැරදි සිදු වී ඇති බව හඳුනාගෙන ඇත.**

  **A - විකුණුම් ජ'නලයේ එකතුව රු. 50,000 කින් අඩු වී ඇත.**
  **B - ආපසු යැවුම් රු.5000 ක් ගැනුම් ගිණුමට බැරකර ඇත.**
  **C - රු. 3000 ලැබූ පොලි ගෙවූ පොලී ලෙස සටහන් කර ඇත.**
  **D - රු. 1000 ගෙවූ කොමිස් ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට ගෙන නැත.**

08. ඉහත වැරදි නිසා ව්‍යාපාරයේ ශුද්ධ ලාභයට වී ඇති ශුද්ධ බලපෑම වන්නේ,

1. රු. 50,000 න් වැඩි වී ඇත
2. රු. 55,000 න් අඩු වී ඇත
3. රු. 56,000 න් අඩු වී ඇත
4. රු. 57,000 න් අඩු වී ඇත
5. රු. 57,000 න් වැඩි වී ඇත (.......)

09. ඉහත වැරදි නිසා අවිනිශ්චිත ගිණුමේ ඇති වී තිබෙන ශේෂය වන්නේ,

1. රු. 5000 ක බැර ශේෂයක්
2. රු. 5000 ක හර ශේෂයක්
3. රු. 6000 ක හර ශේෂයක්
4. රු. 6000 ක බැර ශේෂයක්
5. රු. 7000 ක බැර ශේෂයක් (.......)

10. 2017.04.01 දින VAT බදු සඳහා ලියාපදිංචි වූ සමාගමක් විසින් ඉඩමක් මිලට ගත් අතර, ඒ සම්බන්ධයෙන් පහත වියදම් දරා ඇත.

| | (රු.) |
|---|---|
| ගැනුම් මිල (VAT 15% සහිතව) | 690,000 |
| පැරණි ගොඩනැගිලි ඉවත් කිරීම | 150,000 |
| ඔප්පු ලිවීමේ ගාස්තු | 25,000 |
| සමාගමේ නාම පුවරුව සවිකිරීම | 20,000 |
| ඉවත් කළ ගොඩනැගිලි උපකරණ විකුණුම් | 40,000 |

ඉඩම මිලදී ගත් දිනට පොත්වල හඳුනාගත යුතු පිරිවැය වන්නේ,

1. රු. 600,000 2. රු. 690,000 3. රු. 735,000
4. රු. 865,000 5. රු. 885,000 (.......)

11. සී/ස සමාගමක 2018.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 125,000 ක් විය. නමුත් පහත ගනුදෙනු පිළිබඳව ගිණුම් තබා නැත.

- රු. 5000 ක බොල්ණය කපාහැරීම
- රු. 10,000 ක පමා පොලී අයකිරීම
- ණයගැතියන්ගෙන් ලැබූ රු. 5000 චෙක්පතක් අගරුවීම
- 10% අඩමාණ ණය වෙන්කිරීම

ඉහත වැරදි නිවැරදි කළ පසු ණයගැති පාලන ගිණුමේ ශේෂය වන්නේ,

1. රු.81000 2. රු. 90000 3. රු. 95000 4. රු. 110000 5. රු. 135100 (.......)

12. පාසලක වාණිජ සංගමයක 2017.04.01 දිනට පහත ශේෂයන් දැකිය හැකි විය.

- හිඟ හිටි සාමාජික මුදල රු. 8000
- යාවජීව සාමාජික අරමුදල රු. 64000

1. වර්ෂය තුළ රු. 65200 ක සාමාජික මුදල් ලැබී ඇති අතර 2018.03.31 දිනට කලින් ලැබූ සාමාජික මුදල රු. 5000 කි
2. යාවජීව සාමාජික අරමුදල 2015.04.01 දින ආරම්භ කර ඇති අතර, එය වසර 10 ක් තුළ ආදායම් තුළ හඳුනාගනී.

2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සාමාජික මුදල් ආදායම සහ එදිනට යාවජීව සාමාජික අරමුදලේ වටිනාකම කොපමණ ද?

| | **2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ආදායම (රු.)** | **2018.03.31 දිනට යාවජීව සාමාජික අරමුදල (රු.)** |
|---|---|---|
| 1. | 52,200 | 80,000 |
| 2. | 60,200 | 56,000 |
| 3. | 60,200 | 8,000 |
| 4. | 65,000 | 56,000 |
| 5. | 65,200 | 80,000 |

(.......)

13. ව්‍යාපාරයක පහත තොරතුරු දැකිය හැකි විය.

1. 2017.04.01 දිනට
   - ඉදිරියට ගෙවූ දුරකථන වියදම් රු. 12000
   - ගෙවිය යුතු වරිපනම් බදු රු. 6000
2. වර්ෂය තුළ ගෙවූ වරිපනම් බදු හා දුරකථන වියදම් පිළිවෙලින් රු. 46000 ක් සහ රු. 54000 කි
3. 2018.03.31 දිනට ගෙවිය යුතු දුරකථන වියදම් හා වරිපනම් බදු පිළිවෙලින් රු. 8000 හා රු. 6000 කි.

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයට හඳුනාගත යුතු වියදම හා 2018.03.31 දිනට මූල්‍ය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු වගකීම වන්නේ,

| | 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු වියදම (රු.) | 2018.03.31 දිනට හඳුනාගත යුතු වගකීම (රු.) |
|---|---|---|
| 1. | 54,000 | 12,000 |
| 2. | 100,000 | 14,000 |
| 3. | 100,000 | 8,000 |
| 4. | 120,000 | 14,000 |
| 5. | 120,000 | 46,000 |

(.......)

- **ප්‍රශ්න අංක 14 හා 15 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**
  - **පැතුම් හා සිතුම් 2:1 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට 2017.04.01 දින නෙතුම් බඳවා ගන්නා ලදී.**
  - **නෙතුම් බඳවාගත් දිනට කීර්තිනාමය රු. 150,000 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, නෙතුම් ප්‍රාග්ධනය ලෙස රු. 250,000 රැගෙන එන ලදී.**
  - **සෑම හවුල්කරුවකුට ම රු. 60000 වාර්ෂික වේතනයක් හිමිය.**
  - **නව ලාභාලාභ අනුපාතය 2:2:1 කි.**
  - **පැතුම්ට හිමි ලාභ කොටස රු. 40000 කි.**

14. හවුල් ව්‍යාපාරයේ වර්ෂයේ ලාභය කොපමණ ද?

1. රු. 40000 2. රු. 80000 3. රු. 100000
4. රු. 120000 5. රු. 280000 (.......)

15. ඉහත ගනුදෙනු මගින් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂයන්ගේ ශුද්ධ වැඩිවීම කොපමණ ද?

1. රු. 150000 2. රු. 250000 3. රු. 300000
4. රු. 400000 5. රු. 500000 (.......)

16. LKAS01 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශනයක මුහුණතේ ඉහළින් අනාවරණය කළ යුතු දෑ සම්බන්ධව නොගැලපෙන පිළිතුර වන්නේ,
1. ව්‍යාපාරයේ නම, මුදල් වර්ගය,මූල්‍ය ප්‍රකාශන සංරචකයේ නම
2. ව්‍යාපාරයේ නම, අධ්‍යක්ෂකවරුන්ගේ නම්, වාර්තාකරන මුදල් වර්ගය
3. ව්‍යාපාරයේ නම, වාර්තාකරන කාලපරිච්ඡේදය, වාර්තාකරන මුදල් වර්ගය
4. ව්‍යාපාරයේ නම, කාලපරිච්ඡේදය, තනි ව්‍යාපාරයක්ද, සමූහ ව්‍යාපාරයක්ද යන්න.
5. ව්‍යාපාරයේ නම, මුදල් වර්ගය, තනි ව්‍යාපාරයක්ද, සමූහ ව්‍යාපාරයක්ද යන්න. (.......)

17. සීමිත රොබේරු පොදු සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, අධ්‍යක්ෂවරු විසින් 2018.06.30 දින අනුමත කරන ලදී. 2018.03.31 දින සිට 2018.06.30 දින දක්වා කාලයේ දී පහත සිදුවීම් සමාගමේ සිදුවිය.

A - 2018.04.10 දින සිදුකළ ණයට විකුණුම් නිසා ඇති වූ රු. 50000 ක ශේෂයක් සහිත ණයගැතියකු 2018.06.15 දින බුන්වත් විය.

B - 2018.03.31 දිනට පිරිවැය රු. 200,000 ක් වූ තොගයක් 2018.06.01 දින රු. 15000 ක විකුණුම් වියදමක් දරා රු. 210,000 කට විකිණීම.

C - 2017.06.30 දින සේවයෙන් ඉවත් කරන ලද සේවකයකු සමාගමට විරුද්ධව රු. 500,000 ක වන්දි ඉල්ලා පැවරූ නඩුවකට වන්දි ගෙවිය යුතු යැයි 2018.06.15 දින අධිකරණ තීන්දුවක් ලැබීම.

D - 2018.03.31 දින සිට පැවති රු. 50000 ක් වූ තොගයක් 2018.06.01 දින ගින්නකින් විනාශ වීම.

LKAS 10 (වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වල ඉහත කුමන සිදුවීම් ගලපන සිද්ධීන් ලෙස සලකනු ලබයි ද?

1. A හා B පමණි 2. B හා C පමණි 3 A,B හා D පමණි
4. B,C හා D පමණි 5. A,B,C හා D යන සියල්ල (.......)

18. ක්ෂය වන වත්කම ඵලදායී ජීවකාලය වෙනස් වීමක් නිසා එහි සිදුවන බලපෑම ගිණුම්ගත කරනුයේ,
1. අනාගත ගිණුම් වර්ෂ වලට පමණක් බලපාන පරිදිය.
2. වර්තමාන ගිණුම් වර්ෂයට පමණක් බලපාන පරිදිය.
3. වර්තමාන ගිණුම් වර්ෂයට මෙන්ම අනාගත වර්ෂ වලටද බලපාන පරිදිය.
4. වර්තමාන ගිණුම් වර්ෂයට බලනොපාන හා අනාගත ගිණුම් වර්ෂ වලට බලපාන පරිදිය.
5. වර්තමාන ගිණුම් වර්ෂයට බලපාන පරිදි හා අතීත ගිණුම් වර්ෂ වලට බලපාන පරිදිය. (.......)

19. LKAS 08 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි) ප්‍රමිතයට අනුව පහත සඳහන් ඒවායින් ඇස්තමේන්තු වෙනස්වීම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගත හැක්කේ,

A - තොග අගය කිරීම FIFO ක්‍රමය වෙනුවට ප්‍රවර්තන වර්ෂයේ සිට WAC ක්‍රමය යොදා ගැනීම.

B - පෙර වර්ෂයේ කපා හරින ලද රු. 20,000 ක ණයගැතියකුගේ ණය ප්‍රවර්තන වර්ෂයේදී ලැබීම.

C - ප්‍රවර්තන වර්ෂයේ සිට දේපල පිරියත හා උපකරණ ක්ෂය කිරීම සරළ මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමයට මාරු වීම.

D - යන්ත්‍ර නවීකරණය හේතුවෙන් එහි ඵලදායී ජීවකාලය වසර 8 සිට 10 දක්වා වැඩිවන බව හා සුන්බුන් අගයද රු. 50,000 කින් වැඩිවන බව තීරණය කිරීම.

1. A හා B පමණි 2. B හා D පමණි 3 A,B හා D පමණි
4. C හා D පමණි 5. A,B,C හා D යන සියල්ලම (.......)

20. සමාගමක 2018.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ පහත තොරතුරු දැකිය හැකිවිය.
2017.04.01 දිනට බදු වෙන්කිරීම රු. 90000
ගෙවූ බදු රු. 220000
2016/2017 වර්ෂය සඳහා ගෙවූ රු. 100,000 ක බදු මුදල ගෙවූ බදු තුළ ඇතුළත් වේ.
2017/2018 වර්ෂයේ ඇස්තමේන්තු ගත ආදායම් බද්ද රු. 180,000 කි.
2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේදී ආදායම් ප්‍රකාශනය තුළ ලාභයට ගැලපිය යුතු බදු මුදල හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඇතුළත් කළ යුතු උපචිත බදු මුදල වනුයේ,

| | ලාභයට ගැලපිය යුතු බදු මුදල (රු.) | උපචිත බදු මුදල (රු.) |
|---|---|---|
| 1. | 120,000 | 10,000 |
| 2. | 130,000 | 30,000 |
| 3. | 180,000 | 60,000 |
| 4. | 190,000 | 60,000 |
| 5. | 190,000 | 90,000 |

(.......)

21. 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමක දේපළ පිරියත හා උපකරණ සම්බන්ධ පහත තොරතුරු දී ඇත.
- මෝටර් රථ විකිණීමේ ලාභය රු. 50,000
- දේපළ පිරියත හා උපකරණ ක්ෂය රු. 600,000
- ප්‍රත්‍යාගණන සංචිතය ( 2016.04.01 දින ඉඩම් ප්‍රත්‍යාගණනයෙන් ලැබූ ලාභය) රු. 250,000
- 2018.03.31 දින ඉඩම් ප්‍රත්‍යාගනනයෙන් රු. 300,000 ක අලාභයක් සිදු වී ඇත.

මෙම ගණුදෙනු හා සිද්ධීන් නිසා 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමෙහි වර්ෂයේ ලාභයට හා මුළු විස්තීරණ ආදායමට කරන ශුද්ධ බලපෑම වනුයේ,

| | වර්ෂයේ ලාභය (රු.) | මුළු විස්තීරණ ආදායම (රු.) |
|---|---|---|
| 1. | 550,000 කින් අඩුවේ | වෙනසක් සිදුනොවේ. |
| 2. | 600,000 කින් අඩුවේ | 55,000 කින් අඩුවේ |
| 3. | 600,000 කින් අඩුවේ | 600,000 කින් අඩුවේ |
| 4. | 600,000 කින් අඩුවේ | 850,000 කින් අඩුවේ |
| 5. | 850,000 කින් අඩුවේ | 850,000 කින් අඩුවේ |

(.......)

22. පහත තොරතුරු 2018.03.31 දිනෙන් අවසන් වසර සඳහා සමාගමකට අදාළ වේ.

| | **රු '000' වලින්** |
|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | 1500 |
| වර්ෂය තුළ ගෙවූ ආදායම් බදු | 250 |
| වාර්ෂික ක්ෂය | 100 |
| මෝටර් රථ විකිණීමේ අලාභය | 50 |
| ගෙවූ ණය පොළී | 50 |
| තොග වැඩිවීම | 25 |
| ණයහිමියෝ වැඩිවීම | 35 |

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පෙර ලාභය වනුයේ,

1. රු. 1,360,000 2. රු. 1,640,000 3. රු. 1,660,000
4. රු. 1,710,000 5. රු. 1,740,000 (.......)

- **ප්‍රශ්න අංක 23 සහ 24 ට පිළිතුරු සැපයීමට සමාගමක පහත තොරතුරු භාවිතා කරන්න.**

| | **2018.03.31 දිනට (රු'000')** | **2017.03.31 දිනට (රු.'000')** |
|---|---|---|
| **ප්‍රකාශිත සා.කො.ප්‍රාග්ධනය** | **2100** | **2050** |
| **රඳවාගත් ඉපැයුම්** | **900** | **350** |
| **මුළු වත්කම්** | **5500** | **4500** |

**2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා,**

- **බැංකු ණය පොළී රු. 150,000**
- **ගෙවූ අතුරු ලාභාංශ රු. 150,000**
- **වර්ෂය සඳහා ආදායම් බදු රු. 100,000**

**සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය වැඩි වී ඇත්තේ සංචිත ප්‍රාග්ධනිත කිරීම නිසාය.**

23. සමාගමේ මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (සාමාන්‍ය මුළු වත්කම් මත) වනුයේ,

1. 11% 2. 12% 3. 13% 4. 18% 5. 20% (.......)

24. 2018.03.31 දිනට සමාගමේ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය වනුයේ,

1. 20% 2. 25% 3. 33.3% 4. 35.7% 5. 50% (.......)

25. පහත සඳහන් ඒවායින් ආර්ථික ඇණවුම් ප්‍රමාණ ආකෘතියට (EOQ) අදාළ නිවැරදි උපකල්පන මොනවා ද?

A - ස්ථිර වූත් දන්නා වූත් තොග ලබාගැනීමේ පිරිවැයක් ඇතිබව
B - ස්ථිරවූත් දන්නා වූත් රඳවා ගැනීමේ පිරිවැයක් ඇතිබව
C - ඇනවුම් කරන මුළු ප්‍රමාණයම එකවර ලැබෙන බව
D - යළි ඇනවුම් මට්ටමට පැමිණි විගස යළි තොග ලබාගන්නා බව

1. A හා B පමණි 2. A,B හා C පමණි 3 A,B හා D පමණි
4. B,C හා D පමණි 5. A,B,C හා D යන සියල්ල (.......)

26. පහත තොරතුරු නිෂ්පාදන සමාගමක $M_1$ නැමැති අමුද්‍රව්‍ය අයිතමයට අදාල වේ.

- මාසික අවශ්‍යතාව 250 Kg
- එක් ඇණවුමක පිරිවැය රු. 60
- 1 Kg ක පිරිවැය රු. 10

තොග රඳවා ගැනීමේ පිරිවැය ඒකකයක පිරිවැයෙන් 10% කි. ඉහත තොරතුරු ඇසුරින් වරකට ඇණවුම් කළ යුතු කිලෝග්‍රෑම් ප්‍රමාණය හා වර්ෂයක් තුළ ඇණවුම් කළ යුතු ඇණවුම් සංඛ්‍යාව කොපමණ ද?

| | වරකට ඇණවුම් කළ යුතු කිලෝග්‍රෑම් | ඇණවුම් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | 60 | 50 |
| 2. | 250 | 12 |
| 3. | 300 | 10 |
| 4. | 600 | 5 |
| 5. | 600 | 12 |

(.......)

27. යම් සමාගමක 2018 මාර්තු මාසයේ වැටුප් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| සේවකයින්ට ගෙවූ වැටුප් | රු. 171000 |
| සේවකයින්ගේ වැටුපෙන් අඩුකර ගැනීම්, | |
| වැටුප් අත්තිකාරම් | රු.30000 |
| උත්සව අත්තිකාරම් | රු. 24000 |
| EPF දායකය | රු. 25000 |
| සේව්‍ය දායකයත් | |
| EPF | රු. 37500 |
| ETF | රු. 7500 |

2018 මාර්තු මාසයේ සේවක දළ වැටුප් සහ සමාගමේ සේවකයින් සම්බන්ධ මුළු වියදම කුමක්ද?

| | දළ වැටුප රු. | සේවකයින් සම්බන්ධ මුළු වියදම (රු.) |
|---|---|---|
| 1. | 171,000 | 250,000 |
| 2. | 250,000 | 295,000 |
| 3. | 250,000 | 241,000 |
| 4. | 196,000 | 241,000 |
| 5. | 250,000 | 171,000 |

(.......)

28. අනෙකුත් සාධක ස්ථාවරව පවතින විට විකුණුම් පරිමාවෙහි අඩුවීමක් සිදුවන විට පහත කුමන ප්‍රකාශ නිවැරදි වේද?

A - ඒකකයක දායකය වෙනස් නොවේ.
B - සමච්ඡේදන ලක්ෂ්‍ය අඩුවේ.
C - ආරක්ෂිත ආන්තිකය වැඩිවේ.
D - ලාභය අඩුවේ.

1. A හා D පමණි  2. A හා C පමණි  3 A,C හා D පමණි
4. B,C හා D පමණි  5. A,B හා D පමණි  (.......)

29. සමාගමක නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත යම් භාණ්ඩයකට අදාළ නිෂ්පාදන මට්ටම හා මුළු පිරිවැය පහත දී ඇත.

| නිෂ්පාදන මට්ටම ඒකක | මුළු පිරිවැය (රු.) |
|---|---|
| 5000 | 500,000 |
| 6000 | 540,000 |

ඒකකයක විචල්‍ය පිරිවැය සහ මුළු ස්ථාවර පිරිවැය පිළිවෙලින්,

| | නිෂ්පාදන මට්ටම ඒකක | මුළු පිරිවැය (රු.) |
|---|---|---|
| 1. | 40 | 200,000 |
| 2. | 40 | 300,000 |
| 3. | 50 | 300,000 |
| 4. | 90 | 200,000 |
| 5. | 100 | 300,000 |

(.......)

30. අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී, පහත කුමක් ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය අඩු වීමට බලපායිද?

A - වට්ටම් අනුපාතිකය වැඩිවීම
B - වාර්ෂික ක්ෂය වැඩිවීම
C - ව්‍යපෘතියේ වෙළඳපොළ සමීක්ෂණ වියදම් වැඩිවීම
D - ආරම්භක ආයෝජනය වැඩිවීම.
E - ශුද්ධ මෙහෙයුම් මුදල් ගලාඒම අඩුවීම

1. A,B හා E පමණි  2. A,C හා E පමණි  3 A,D හා E පමණි
4. C,D හා E පමණි  5. B,C,D හා D පමණි  (.......)

- **ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

31. සී/ස සමාගමක බාහිර පාර්ශවයන් සඳහා සකස් කරන මූල්‍ය ප්‍රකාශන ........................................................ මූල්‍ය ප්‍රකාශන ලෙසත් අභ්‍යන්තර (කළමනාකරුවන්) පාර්ශවයන්ගේ අවශ්‍යතාවය සඳහා සකස් කරන මූල්‍ය ප්‍රකාශන ........................................................ මූල්‍ය ප්‍රකාශන ලෙසත් හැඳින්වේ.

32. පහත ගනුදෙනුවට වලට අදාල ගිණුම්කරණ සංකල්පය ලියා දක්වන්න.
1. අවසාන ණයගැති ශේෂය මත අඩමාණ ණය වෙන්කිරීම ........................................
2. කල්බදු මත මිලට ගත් වත්කමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීම ........................................
3. අයිතිරු ව්‍යාපාරයට යෙදූ මුදල ගිණුම්ගත කිරීම ........................................
4. ස්ටෙප්ලරයක් මිලට ගැනීම ලිපිද්‍රව්‍ය වියදම් ලෙස සැලකීම ........................................

33. ව්‍යාපාරයක චෙක්පත් මගින් කරන ගනුදෙනු .......................................... ගිණුමේ සටහන් කරන අතර, කාසි හා නෝට්ටු මගින් කරන ගෙවීම් .................................................... ගිණුමේ සටහන් කරයි.

34. සී/ස සමාගමක 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ පහත ගනුදෙනු සිදුවී ඇත.
- 2014.04.01 දින රු. 600,000 කට මිලදී ගත් යන්ත්‍රයක ඵලදායි ජීවකාලය වසර 06 ක් ලෙස 2017.04.01 දින ඇස්තමේන්තු කර ඇත.
- 2017.10.01 දින රු. 500,000 ට ලී බඩු මිලට ගෙන ඇත.
- දේපල පිරියත උපකරණ වාර්ෂිකව 10% බැගින් සරළ මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

1. 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත යුතු ක්ෂය ප්‍රමාණය කොපමණද? ..............................................................................
2. 2018.03.31 දිනට දේපළ පිරියත උපකරණ වල ධාරන අගය කොපමණ ද? ........................................................

35. නිමි ඇඳුම් නිෂ්පාදන සමාගමක 2018.05.20 දින ඇති වූ ගංවතුරින් රු. 100,000 වටිනා රෙදි තොගයක් හානියට පත් වී ඇත.
1. ඉහත තොග හානිය ගිණුම්ගත කිරීමට අදාල ද්විත්ව සටහන ලියා දක්වන්න.

..............................................................................................................................................

..............................................................................................................................................
2. පහත ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) මෙම තොග හානිය ගලපනු ලබන්නේ නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය තුළය ................................

(ආ) මෙම තොග හානිය ගලපනු ලබන්නේ වෙනත් වියදම් තුළය ................................

36. 2016.04.01 දින මෝටර් රථයක් සිංහ ක්‍රීඩා සමාජයට විශේෂ පරිත්‍යාගයක් ලෙස ලැබුණි. මෙම පරිත්‍යාගය වසර 10 ක් තුළ ආදායම තුළ හදුනාගනී. 2017.03.31 දිනට මෝටර් රථ පරිත්‍යාග අරමුදල් ගිණුමේ ශේෂය රු. 1,350,000කි.

1. 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ ක්ෂය ප්‍රමාණය ..............................................................

2. 2018.03.31 දිනට මොටර් රථ පරිත්‍යාග අරමුදල් ගිණුමේ ශේෂය ..............................................................

37. 2018.03.31 දිනට ණයගැති ලෙජර ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 85,000 කි. පසුව පහත වැරදි සිදුවී ඇති බව හඳුනාගන්නා ලදී.

1. රු. 50,000 ක විකුණුම් ඉන්වොයිසියක් දෙවරක් සටහන් වී ඇත.
2. රු. 12,000 බොල් ණය කපාහැරීම ණයගැතියාගේ ගිණුමේ සටහන් කර නැත.
3. 10% වට්ටමකට යටත්ව ණයගැතියෙකුගෙන් ලැබූ රු. 81,000 ක චෙක්පතක් අගරුවීම පොත්වල ලියා නැත.

(අ) 2018.03.31 දිනට සංශෝධිත ණයගැති පාලන ගිණුමේ ශේෂය කොපමණ ද? ...................................................

(ආ) ඉහත වැරදි නිසා ලාභයට කරන ශුද්ධ බලපෑම කුමක් ද? ...................................................

38. 2018.03.31 දිනට බැංකු ගිණුමේ පැවති ශේෂය රු. 85,000 කි.

- නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 20,000 කි.
- බැකු ප්‍රකාශනයේ සඳහන් බැංකු ගාස්තු රු. 5000 ක් සහ සෘජු ප්‍රේෂණ රු. 15,000 ක් විය.
- බැංකුව විසින් ව්‍යාපාරයේ ගිණුමට වැරදීමකින් හර කර ඇති වටිනාකම රු. 10,000 කි.
- තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 120,000 කි.

1. 2018.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු මුදල් ශේෂය කොපමණ ද? ....................................
2. බැංකු ප්‍රකාශනයේ පැවති ශේෂය/ අයිරාව කොපමණ ද? .......................................................................

39. 1890 හවුල් ආඥා පනතේ 24 වගන්තියට අනුව පහත ප්‍රකාශන **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

1. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනයට 10% ක ප්‍රාග්ධන පොලී ගෙවිය යුතුය. .......................................
2. කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම තුළම ගැලපීම නිසා මුළු හිමිකම වෙනස් නොවේ. .......................................
3. හවුල්කරුවන්ගේ මුළු හිමිකම, ප්‍රාග්ධන ගිණුම් ශේෂ මගින් පෙන්නුම් කෙරේ .......................................
4. හවුල්කරුවන් සපයා ඇති ණය සඳහා 5% වාර්ෂික පොළියක් ගෙවිය යුතුය .......................................

40. අමල් සහ බිමල් 3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට කමල් බඳවාගත් අතර, නව ලාභාලාභ අනුපාතය 3:2:2 විය. කමල් බඳවාගත් දිනට කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම තුළින් ගැළපූ අතර කමල්ගේ කීර්තිනාම කොටස රු. 100,000 කි.
කමල් බඳවාගත් දිනට මුළු කීර්තිනාමය කොපමණ ද? .......................................................................

41. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න හිස්තැන මත ලියන්න.

**සත්‍ය / අසත්‍ය**

1. ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් කිරීමක් යනු ව්‍යාපාරයක වත්කම් හෝ වගකීම්වල ධාරණ අගයට කරන ගැලපීමකි. ................................................
2. සාමාන්‍ය කොටස් කරුවන්ට ලාභාශ ගෙවූ විට වර්ෂයේ ලාභය අඩුවේ. ................................................
3. අසම්භාව්‍ය වගකීම් ආයතනයක මූල්‍ය ප්‍රකාශන වල හදුනාගනී. ................................................
4. කල්බදු ණයහිමියකුට වාර්ෂික පොලී රහිත කල්බදු වාරිකය ගෙවීම මූල්‍ය ක්‍රියාකාරකමක් වේ. ................................................

42. සමාගමක් 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී කොටසක් රු. 50 බැගින් සාමාන්‍ය කොටස් 100,000 ක් නිකුත් කරන ලදී. සමාගම රු. 10 000 ක් කොටස් නිකුත් කිරිමේ වියදම් ලෙස දරන ලදී. මුළු මුදල සමඟ කොටස් 150,000 ක් සඳහා අයදුම් පත්‍ර ලැබුණි. වැඩිපුර ලද කොටස් ප්‍රතික්ෂේප කර අයදුම්කරුවන් වෙත ආපසු යවන අතර, ඉතිරිය සමානුපාතිකව විභාජනය කරන ලදී. පහත දෑ ගණනය කරන්න.

1. 2018.03.31 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වැඩිවීම රු. ..........................................................
2. ඉහත ගනුදෙනුව නිසා වර්ෂය තුල හිමිකමෙහි ශුද්ධ වැඩිවීම රු. ..........................................................

43. සීමිත පොදු සමාගමකට අදාල තොරතුරු පහත දී ඇත.

| | රු. '000' |
|---|---|
| - 2017.03.31 දිනට සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටස් 100000) | 7000 |
| - 2017.03.31 දිනට රඳවාගත් ඉපයුම් | 2000 |

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ පහත දෑ සිදුවී ඇත.

1. 2017.04.01 දින එදිනට පැවති සෑම සාමාන්‍ය කොටස් 5 කටම එක බැගින් කොටසක් රු. 50 බැගින් සංචිත ප්‍රාග්ධනිත කිරිම
2. 2018.03.31 දින එදිනට පැවති සාමාන්‍ය කොටස් 6 කටම එක බැගින් වන අනුපාතයට කොටසක් රු. 60 බැගින් හිමිකම් නිකුතුවක් කිරීම.

අවශ්‍ය වන්නේ,

(අ) සංචිත ප්‍රාග්ධනීන කිරීමට අදාල ජ'නල් සටහන (සංලක්‍ෂය අවශ්‍ය නොවේ)

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ආ) 2018.03.31 දිනට හිමිකමේ සිදු වූ වැඩිවීම රු. ..........................................................

44. LKAS 08 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි) ප්‍රමිතයට අනුව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වෙනස් කළ හැකි අවස්ථා දෙක ලියන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................

45. පහත තොරතුරු සමාගම් දෙකකට අදාල වේ.

| | **කාමන් සමාගම** | **නාදන් සමාගම** |
|---|---|---|
| තොග පිරිවැටුම් අනුපාතය | වාර 8 | වාර 10 |
| ක්‍ෂණික අනුපාතය | 1:1 | 0.5:1 |
| පොළී ආවරණ අනුපාතය | වාර 8 | වාර 5 |
| මුළු වත්කම් වලට ප්‍රතිලාභ අනුපාතය | 40% | 35% |

ඉහත තොරතුරු ඇසුරින් පහත එක් එක් අයිතමයට අදාළ සමාගම නම් කරන්න.

1. කාරක ප්‍රාග්ධනය යොදා ගැනීමේ කාර්යක්‍ෂමතාවය වැඩි සමාගම ..................................
2. අවතෝලනයක් ඇති සමාගම ..................................
3. ද්‍රවශීලතාව අනුව වඩා හොඳ සමාගම ..................................
4. වත්කම් කාර්යක්‍ෂමව යොදවා ඇති සමාගම ..................................

46. තනි භාණ්ඩයක් නිපදවන ව්‍යාපාරයක ඒකක 10000 ක දී මුළු විකුණුම් වටිනාකම රු. 1,500,000 කි. දායක විකුණුම් අනුපාතය 20% ක් වේ. මුළු ස්ථාවර පිරිවය රු. 180,000 කි. පහත දෑ ගණනය කරන්න.

1. ඒකකයක විචල්‍ය පිරිවැය රු. ...........................................

2. සමච්ඡේදන ලක්ෂය ඒකක වලින් රු. ...........................................

47. විවිධ ආයෝජන සඳහා මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරිමේදී යොදා ගන්නා උපකල්පන 2 ක් ලියන්න.

1. ..........................................................................................................................................................

..........................................................................................................................................................

2. ..........................................................................................................................................................

..........................................................................................................................................................

48. ඉසුරු නිෂ්පාදන ව්‍යාපාරයේ එක්තරා අමුද්‍රව්‍යයක් සම්බන්ධව පහත දත්තයන් අදාළ වේ.

- උපරිම ඇනවුම් කාලය දින 6
- අවම ඇනවුම් කාලය දින 2
- අවම භාවිතය දිනකට 60 Kg
- යළි ඇනවුම් ප්‍රමාණය 500Kg
- උපරිම තොග මට්ටම 980 Kg

දිනක උපරිම භාවිතය කොපමණ ද? ..........................................................................

- **49 සහ 50 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.**

**සමාගමක් නිපදවනු ලබන භාණ්ඩයක ඒකකයක විචල්‍ය නිෂ්පාදන පිරිවැය රු. 8/- ක් වන අතර, විචල්‍ය විකුණුම් වියදම් ඒකකයන් සඳහා රු. 2 කි. වාර්ෂික ස්ථාවර පිරිවැය රු. 40,000 ක් වන අතර, ඒකකයක විකුණුම් මිල රු. 18 කි. වර්තමාන විකුණුම් ධාරිතාවය වර්ෂයකට ඒකක 6000 කි. සමාගම නව යන්ත්‍රයක් වර්ෂයකට රු. 10,000 ක කුලියක් ගෙවා ලබා ගැනිමට බලාපොරොත්තු වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඒකකයක විචල්‍ය නිෂ්පාදන පිරිවැය රු. 6/- දක්වා අඩුවේ.**

49. නව යන්ත්‍රය කුලියට ගනු ලැබුවහොත් දැනට ලබන ලාභයම ලැබීමට අවශ්‍ය විකුණුම් ඒකක ගණන කොපමණ ද?

..........................................................................................................................................................

50. වර්ෂයයේ විකුණුම් ප්‍රමාණය තවදුරටත් ඒකක 6000 ක් නම් නව යන්ත්‍රය කුලියට ගැනීමෙන් පසු වාර්ෂික ලාභය කොපමණ ද?

..........................................................................................................................................................

***

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 13 - 2018**

## ගිණුම්කරණය II

කාලය පැය තුනයි

උපදෙස්

- ♦ පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හයක ට පමණක් පිළිතුරු සපයන්න.
- ♦ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- ♦ අදාල පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමග අමුණන්න.

01 සීමිත කාමෙල් පොදු සමාගම භාණ්ඩ නිෂ්පාදන සහ අලෙවි සමාගමකි. 2018.03.31 දිනට සමාගමේ සාරාංශ ගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| විස්තරය | හර රු.'000 | බැර රු. '000 |
|---|---|---|
| දේපල පිරියත සහ උපකරණ | 19500 | |
| 2017.04.01 දිනට නිමි තොගය | 500 | |
| ප්‍රාථමික නිෂ්පාදන පිරිවැය | 5800 | |
| පරිපාලන වියදම් | 500 | |
| නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය යන්ත්‍ර (ක්ෂය හැර) | 1200 | |
| අමුද්‍රව්‍ය ගැනුම් හා වියදම් මත ගෙවූ එකතු කළ අගය මත බදු (VAT) | 1150 | |
| 2017.03.31 දිනට අමු ද්‍රව්‍ය තොගය | 250 | |
| බෙදා හැරීමේ වියදම් | 550 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 1220 | |
| ගෙවූ බදු | 300 | |
| බැංකු මුදල් | 350 | |
| විකුණුම් | | 11600 |
| 2017.04.01 දිනට දේපළ පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය | | 4900 |
| අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්ට ගෙවිය යුතු දෑ | | 20 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | | 9000 |
| රඳවාගත් ඉපයුම් | | 3645 |
| විකුණුම් මත එකතු කළ VAT | | 1650 |
| ප්‍රත්‍යාගණන සචිතය - ඉඩම් | | 400 |
| ගෙවිය යුතු EPF | | 30 |
| 2017.04.01 දිනට ආදායම් බදු වෙන්කිරීම | | 75 |
| | **31320** | **31320** |

**අතිරේක තොරතුරු.**

(අ) ශේෂ පිරික්සුමේ දී ඇති ගෙවූ බදු පහත අයිතම් වලින් සමන්විත වේ.

| | **රු. '000'** |
|---|---|
| ගෙවූ VAT බදු | 100 |
| 2016/2017 වර්ෂය සඳහා ගෙවූ ආදායම් බදු | 80 |
| 2017/2018 වර්ෂය සඳහා ගෙවූ ආදායම් බදු | 120 |
| | **300** |

(ආ) රඳවාගත් ඉපයුම් යොදා ගනිමින් වර්ෂය තුළ සාමාන්‍ය කොටස් 20000 ක් කොටසක් රු. 50 බැගින් සංචිත ප්‍රාග්ධනීත කිරීමක් සිදු කර ඇත.

(ඉ) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත ගැලපීම් කළ යුතුවේ.

i) 2018.03.31 දිනට පිරිවැය රු. 600,000 ක් වූ නිමි තොගයෙහි රු. 120,000 ක තොගයක් සුළු හානි සිදු වී ඇති බැවින් වර්ෂය අවසානයට පසුව රු. 2000 ක විකුණුම් වියදමක් දරා රු. 82000 කට මූල්‍ය වාර්තා අනුමැතියට පෙර විකුණන ලදි.

ii) දේපළ පිරියත හා උපකරණ වල සංයුතිය පහත පරිදි වේ.

| | **2018.03.31 දිනට පිරිවැය/වටිනාකම රු. '000'** | **2017.04.01 දිනට සමුච්චිත ක්ෂය රු. '000'** |
|---|---|---|
| ඉඩම් | 8000 | - |
| ගොඩනැගිලි | 4500 | 1200 |
| යන්ත්‍ර | 5000 | 2700 |
| මෝටර් රථ | 2000 | 1000 |
| | **19500** | **4900** |

ගොඩනැලිගිලි හා යන්ත්‍ර පිරිවැයට 10% බැගින් ද මෝටර් රථ පිරිවැයට 20% බැගින් ද ක්ෂය කිරීම ප්‍රතිපත්තිය වේ.

iii) 2018.03.31 දින ඉඩම් රු. 8,500,000 කට ද, ගොඩනැගිලි ප්‍රථම වතාවට රු. 2,500,000 කට වෘත්තීය තක්සේරුකාර ආයතනයක් විසින් තක්සේරු කර ඇත.

iv) ව්‍යාපාරයේ තිබූ මෝටර් රථය 2017.04.01 දින රු. 600,000 කට විකුණා ලද මුදල විකුණුම් ගිණුමට බැර කිරීම හැර වෙනත් සටහනක් තබා නැත. මෙදින මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ සාධාරණ වටිනාකම රුපියල් මිලියන 2.5 ක් වූ නව මෝටර් රථයක් අත්පත් කරගෙන ඇත. මේ සඳහා මූලික තැන්පතුව ලෙස ගෙවූ රු. 500,000 මෝටර් රථ ගිණුමට හර කිරීම හැර වෙනත් කිසිම සටහනක් තබා නැත. කල්බදු කාලය වූ වසර 4 අවසානයේ මෝටර් රථයේ අයිතිය සමාගමට පැවරේ. වාර්ෂික කල්බදු වාරිකය රු. 700,000 ක් (මෙහි ඇතුළත් වාර්ෂික පොලිය රු. 200,000 කි) වන අතර, ප්‍රවර්තන වර්ෂය සඳහා ගෙවූ කල්බදු වාරිකය වෙළඳ ගෙවියුතු දැ ගිණුමට හර කිරීම හැර වෙනත් සටහනක් තබා නොමැත.

v) 15% ක VAT සහිත රු. 46000 ක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් පොත් වලින් මග හැරී ඇති බව අනාවරණය වී ඇත.

vi) සේවක අර්ථසාධක අරමුදල් (EPF) දායකයන් සේවක හා සේව්‍ය පිළිවෙලින් 10% ක් හා 15% බැගින් ද, සේවක භාරකාර අරමුදල් (ETF) දායකය 3% ක් ද දළ වැටුප මත වේ. වර්ෂයට අදාල සේවක EPF දායකය ගිණුම්ගත කිරීම හැර සමාගමේ EPF හා ETF දායකයන් ගිණුම්ගත කර නොමැත.

vii) ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බද්ද බදු පෙර ලාභයෙන් $\frac{1}{4}$ ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී.

**අවශ්‍ය වන්නේ,**

LKAS -01 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතියට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත කාමෙල් පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන්ද ඇතුළුව)

1) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2). 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය

3). 2018.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(ලකුණු 20)**

02. අ) නන්දන සහ වින්දන විසින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර, හවුල් ගිවිසුමේ පහත කොන්දේසි ඇතුළත් වේ.

1. ලාභාලාභ අනුපාතය පිළිවෙලින් 2:1 වේ.
2. සෑම හවුල් කරුවෙකුටම මාසිකව රු. 5000 බැගින් වේතන හිමි වේ.
3. ප්‍රාග්ධන ශේෂ මත 10% ක පොලී ගෙවිය යුතුය.
4. හවුල් කරුවන්ගේ ණය සඳහා 6% ක වාර්ෂික පොලියක් ගෙවනු ලැබේ.

(i) 2017.04.01 දින ව්‍යාපාරයට නව හවුල්කරුවකු ලෙස චන්දන බැඳුණු අතර එදිනට කීර්තිනාමය රු. 300,000 ලෙස ඇස්තමේන්තු කර ඇත.

(ii) චන්දන බැඳුනු පසු ලාභාලාභ අනුපාතය 2:2:1 ලෙස වෙනස් වන අතර, ගිවිසුමේ අනෙකුත් කොන්දේසි එලෙසම පවතී.

(iii) 2017.04.01 දිනට පහත ශේෂයන් දැකිය හැකි විය. (රු. 000)

| | **නන්දන** | **වින්දන** |
|---|---|---|
| මුළු හිමිකම | 500 | 480 |
| ප්‍රාග්ධන ගිණුම් | 400 | 400 |
| ණය ගිණුම | 3200 | |

(iv) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ විකුණුම් පිරිවැය රු. 4,250,000 වන අතර ව්‍යාපාරයේ ලාභාන්තිකය පිරිවැයෙන් 20% කි.

(v) හවුල්කරුවන් කළ ගැනිලි පහත පරිදි වේ. (රු. 000)

| | **නන්දන** | **වින්දන** | **චන්දන** |
|---|---|---|---|
| මුදල් | 50 | 40 | 20 |
| භාණ්ඩ | 20 | 10 | 10 |

(vi) වර්ෂයේ මුළු මෙහෙයුම් වියදම් රු. 358,000 වන අතර, හවුල්කරුවන්ට ගෙවූ පහත වේතන ඒ තුළ ඇතුලත්ව ඇත.

| | | |
|---|---|---|
| නන්දන | රු | 30000 |
| වින්දන | රු. | 20000 |
| චන්දන | රු. | 20000 |

**අවශ්‍ය වන්නේ,**

1) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල්කරවැන්ගේ විසර්ජනයන් සහිතව)

2). 2018.03.31 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම් (අනුතීරු ක්‍රමයට) **(ලකුණු 10)**

ආ) ද ටයිම් ඔරලෝසු නිෂ්පාදන සමාගමේ **නිමැවුම්** හා **එකලස්** ලෙස නිෂ්පාදන අංශ දෙකක් සහ **සේවා** අංශයක් ඇත. සමාගමේ පොදුකාර්ය පිරිවැය පිළිබඳව පහත තොරතුරු සැපයේ.

01. ඇස්තමේන්තු ගත පොදුකාර්ය පිරිවැය (රු.)

| | |
|---|---|
| විදුලිය | 180,000 |
| කම්හල් කුලි | 160,000 |
| යන්ත්‍ර ක්ෂය | 100,000 |
| ආපනශාලා වියදම් | 90,000 |
| වක්‍ර වැටුප් - නිමැවුම් | 60,000 |
| එකලස් | 40,000 |
| සේවා | 50,000 |
| වක්‍ර ද්‍රව්‍ය - නිමැවුම් | 30,000 |
| එකලස් | 20,000 |

02. ටයිම් සමාගමේ අනෙකුත් තොරතුරු

| | නිමැවුම් අංශය | එකලස් අංශය | සේවා අංශය |
|---|---|---|---|
| විදුලි භාවිතය (කිලොවොට් පැය) | 15,000 | 10,000 | 5,000 |
| බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | 180,000 | 90,000 | 90,000 |
| යන්ත්‍ර පිරිවැය (රු.) | 360,000 | 180,000 | 60,000 |
| අයවැයගත යන්ත්‍ර පැය | 50,000 | 10,000 | - |
| අයවැයගත ශ්‍රම පැය | 5,000 | 28,000 | - |
| සේවක සංඛ්‍යාව | 40 | 30 | 20 |

03. සේවා අංශයේ සේවා වලින් 60% නිමැවුම් අංශයට වේ.
04. නිමැවුම් අංශය යන්ත්‍ර පැය මතත් එකලස් අංශය ශ්‍රම පැය මතත් පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කෙරේ.
05. ඔරලෝසුවක අයවැයගත සෘජු ද්‍රව්‍ය පිරිවැය රු. 350 කි.
06. ඔරලෝසුවක් නිපදවීම සඳහා ඇස්තමේන්තු ගත යන්ත්‍ර පැය ගණන 5 ක් වන අතර ශ්‍රම පැය 3 ක් වේ.

**අවශ්‍ය වන්නේ,**

1) පොදු කාර්ය පිරිවැය විභාජන පත්‍රිකාව (ද්විතියික විභාජනය ද සමග)
2) නිෂ්පාදන අංශ සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත
3) ඔරලෝසුවක මුළු නිෂ්පාදන පිරිවැය **(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

03. 2018.04.01 දිනට මිහිරංග ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දී ඇත.

| | **රු. '000'** |
|---|---|
| දේපළ පිරියත හා උපකරණ | 240 |
| තොගය | 60 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 20 |
| බැංකු | 40 |
| | **360** |
| හිමිකම් | 175 |
| බැංකු ණය | 100 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 60 |
| වෙනත් ගෙවිය යුත දෑ | 25 |
| | **360** |

2018 අප්‍රේල් මාසයේදී සිදු වූ ගනුදෙනු පහත දී ඇත.

i. පිරිවැය රු. 50000 ක් වූ භාණ්ඩ රු. 75000 කට ණයට විකිණීම
ii. 10% ක වට්ටමකට යටත්ව ණයගැතියන්ගෙන් ලද මුදල රු. 45000 කි.
iii. රු. 40000 ක භාණ්ඩ ණයට මිලදී ගැනීම
iv. රු. 30000 ක ණය හිමි ශේෂයකට රු. 20000 ක ණයගැති ශේෂය හිලව් කර ඉතිරිය මුදලින් ගෙවීම.
v. මිහිරංග, ව්‍යාපාරයේ අප්‍රේල් මාසයේ දුරකථන බිල වූ රු. 4000 තම පුද්ගලික මුදලින් ගෙවා දැමීම
vi. අප්‍රේල් මාසයේ විදුලි බිල වූ රු. 2000 සඳහා චෙක්පතක් නිකුත් කිරීම.
vii. රු. 2000 ක පොළී සහිතව රු. 12000 ක බැංකු ණය වාරිකය ගෙවීම
viii. විදුලි බිල සඳහා නිකුත් කළ චෙක්පත් අගරු වීම.
ix. රු. 10000 ක තොගයක් හදිසි ගින්නකින් විනාශ වී ඒ සඳහා 80% ක රක්ෂණ වන්දියක් ලැබීම.

**අතිරේක තොරතුරු.**

(i) සියළුම මුදල් ගනුදෙනු බැංකු ගිණුමක් ආශ්‍රයෙන් සිදුකරනු ලැබේ.

(ii) 2018 අප්‍රේල් 30 දිනට ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශනයේ ශේෂය එදිනට මුදල් ගිණුමේ ශේෂය සමඟ පහත සඳහන් කරුණු හේතුවෙන් එකඟ නොවීය.

අ) ව්‍යාපාරය විසින් තැන්පත් කළ රු. 10,000 ක චෙක්පත බැංකුව විසින් වැරදීමකින් වෙනත් ගිණුම් හිමියෙකුගේ ගිණුමට බැර කර තිබීම

ආ) ණයගැතියකු විසින් බැංකුවේ සෘජුවම තැන්පත් කළ රු. 5000 ක චෙක්පත් මුදල් ගිණුමේ සටහන් වී නොතිබීම.

ඉ) බැංකුව විසින් අය කර තිබූ බැංකු ගාස්තු රු. 1000 මුදල් ගිණුමේ සටහන් වී නොතිබීම.

(iii) දේපල පිරියත හා උපකරණ පිරිවැය මත 10% බැගින් වාර්ෂිකව සරළ මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

අවශ්‍ය වන්නේ,

1) ඉහත අංක (i) සිට (ix) දක්වා ගණුදෙනු වල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිතා කරමින් පෙන්නුම් කර, එක් එක් අගය ඉදිරියෙන් එය වැඩිවේ නම් (+) ද අඩු වේ නම් (-) ද යන්න සඳහන් කිරීම. (පහත ආකෘතිය භාවිතා කරන්න).

| ගනුදෙනු අංකය | දේපල පිරියත උපකරණ | තොගය | වෙළඳ ලැබිය යුතු දෑ | බැංකු | වෙළඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | බැංකු ණය | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

2). 2018.04.30 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කළ යුතු මුදල් ශේෂය හා අප්‍රේල් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය

3) 2018.04.30 දිනෙන් අවසන් මාසය සඳහා මිහිරංග ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය **(ලකුණු 15)**

04. (අ) ''ජනහඳ'' සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් මාසයේ ණයගැති විස්තර පහත දැක්වේ.

- 2018.03.01 දිනට ණයගැති ලෙජරයේ ශේෂ

| | රු. |
|---|---|
| රංග | 10,000 |
| සුරංග | 30,000 |
| එරංග | (7,000) |
| විරංග | 15,000 |
| | **48,000** |

- මාර්තු මාසයේ මූලික පොත්වල සාරාංශයන්

**මුදල් ලැබීම් ජ'නලය**

| විස්තරය | වට්ටම් (රු.) | මුදල (රු.) | විකුණුම් (රු.) | ණයගැතියෝ (රු.) |
